ලිපිගොනු අංකය:- 2000/03

ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் திணைக்களம்
LAND COMMISSIONER'S DEPARTMENT
අංක 7, ග්‍රෙගරි මාවත, කොළඹ 7-00700
இல. 7, கிரகரி மாவத்தை, கொழும்பு 7-00700
No. 7, Gregory's Avenue, Colombo 7-00700

(75)

5/2/6/1995/ජාගුම්

684051

2000.04.28

සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන් වෙත.

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

## ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉඩම් කච්චේරි මඟින් රජයේ ඉඩම් බෙදා දීම

ඉඩම් රාජකාරී කටයුතු සම්බන්ධීකරණය සහ අධීක්ෂණය කළ දිසාපති කාර්යාල එම කටයුතු වලින් බැහැර වීමත් සමඟම, ඉඩම් රාජකාරි ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ඉටු කිරීම ආරම්භ වීමෙන් පසු, රජයේ විවිධ දෙපාර්තමේන්තු, ආයතන සතු ඉඩම් සහ රක්ෂිතයන් මහජනයා අතර බෙදාදීම පිළිබඳව හා ඉඩම් මැනීම පිළිබඳව තැෂිතර්ම හා ඉඩම් අමාත්‍යාංශය ලේකම් වෙත විවිධ වාර්තා ඉදිරිපත් වී තිබේ.

ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් අලුතින් ඉඩම් බෙදාදීමක් සඳහා අවශ්‍ය කට්ටි කැබීමේ සැලැස්මක් සකස්කර දෙන ලෙස වීඩීමක් ඉල්ලීමක් මැනුම්පති වෙත ඉදිරිපත් කළ අවස්ථාවක, මැනුම්පති විසින් එම ඉඩමේ අයිතිය පිළිබඳව විමසීමක් කරනු නොලැබේ. මැනුම් ආඥා පනත අනුව එවැනි පරීක්ෂණයක් කළ යුතු නොවන අතර, මැනුම් කිරීමට ගනු ලැබූ ඉඩම කිරවුල් රජය සතු ඉඩමක් ලෙස මැනුම්පති විසින් පිළිගැනීමෙන් අනතුරුව බලයලත් නිලධාරීන්ගේ ඉල්ලීම පරිදි අවශ්‍ය කිම් කට්ටි සැලසුම් සකස් කර භාරදීම ඔහුගේ රාජකාරිය වනු ඇත.

එවකට දිසාපතිවරුන් විසින් ඉඩම් බෙදා දී ඇති අවස්ථාවලදී, ඒ සඳහා සුදුසු ඉඩම් තෝරා ගැනීම දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයේ ප්‍රධානත්වයෙන් පත්කළ කමිටුවක් මඟින් කළ අතර, යෝජිත ඉඩමේ අයිතිය, එහි පුරාවිද්‍යාත්මක වටිනාකම, ඉඩම් බෙදාදීමෙන් සිදුවන පාරිසරික බලපෑම්, ප්‍රදේශයේ ආර්ථිකයට හා අනාගතයේ සිදු කරනු ලබන විවිධ සංවර්ධන යෝජනා ක්‍රම වලට බලපාන ආකාරය පිළිබඳව විශේෂයෙන් සළකා බලනු ලැබූ අතර, ඉඩම් බෙදාදීම පිළිබඳව දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව හා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව සමඟ ද සාකච්ඡා කර ඇත. යෝජිත ඉඩම එවැනි දෙපාර්තමේන්තුවක් හෝ ආයතනයක් භාරයේ පවතී නම්, එම ආයතනයන්ගෙන් හා දෙපාර්තමේන්තු වලින් අවශ්‍ය ඉඩම් ප්‍රමාණය නිදහස් කර ගැනීමෙන් පසු ඉඩම් බෙදාදීමේ යෝජනාව රජයේ ඉඩම් පිළිබඳ නිසි බලධාරියා වන ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසු කට්ටි කැඩීමේ සැලැස්ම සකස් කිරීමට මැනුම් නියෝග යවනු ලැබීම සිදුකර තිබේ. මෙලෙස පැහැදිලිව ක්‍රියාකර ලීම මත මිනුම්පතිට මෙම ඉඩම් වල අයිතිය පිළිබඳ විමසීමක් කිරීමේ අවශ්‍යතාවයක් ද නොතිබුණි.

/....2

දුරකථන අංක
தொலைபேசி இல.
Telephone Nos. 695824, 693833, 695844, 694445, 695837, 695044, 684035

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ රජයේ ඉඩම් මැන සැලසුම් කිරීම හා ඉඩම් බෙදාදීම පිළිබඳ අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙල පැහැදිලිව දක්වා ඇති අතර ඒ අනුව දිසාපතිවරුන් විසින් මෙම කරුණු මැනවින් අවබෝධ කරගෙන ක්‍රියා කර ඇත. එබැවින් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ද ඉඩම් සංවර්ධන ආඥා පනතේ විස්තර කරදී ඇති අන්දමට ඉඩම් කච්චේරි පැවැත්වීම හා කට්ටි කැඩීමේ සැලසුම් ඉල්ලා සිටීමට පෙර ඉඩම් නිදහස්කර ගැනීම සහ අදාළ ආයතන දැනුවත් කර ඔවුන්ගේ එකඟතාවය ලබා ගැනීම ඇතුලු සියලුම කරුණු පිළිබඳව පැහැදිලිව ක්‍රියාකර ඇතැයි යන විශ්වාසය උඩ කට්ටි කැඩීමේ සැලැස්මත් ඉල්ලා සිටීමේදී මැනුම්පති විසින් එම ඉල්ලීම ක්‍රියාත්මක කරනු ලබයි. ඉඩමේ අයිතිය පිළිබඳව මැනුම්පති විසින් උපකල්පනයක් කිරීමක් සිදු නොකරන අතර එය මැනුම්පතිගේ රාජකාරියක් නොවන බවද දන්වනු කැමැත්තෙමි.

ඇතැම් අවස්ථාවලදී ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් ඉඩම් කච්චේරි පැවැත්වීමට ප්‍රථම ඒ සඳහා අනුගමනය කළයුතු ක්‍රියාදාමය අනුගමනය නොකිරීම නිසා පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ඉඩම් පමණක් නොව, වන සංරක්ෂක සහ වනජීවී අධ්‍යක්ෂක සතු ඉඩම් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම සතු ඉඩම් සහ පෞද්ගලික ඉඩම් ද බෙදා දී ඇති බවට ද වාර්තා වී ඇත. එසේම රක්ෂිතවල අනවසරකරුවන් ඉවත් කිරීම සඳහා වන සංරක්ෂක විසින් ඔවුන්ට විරුද්ධව නඩු පවරා ඇති අවස්ථා වලදී වනසංරක්ෂකගෙන් කිසිදු විමසීමකින් තොරව ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් එම ඉඩම් අනවසරකරුවන් නමින් නියමානුකූල කිරීම් පිළිබඳව වාර්තා වී ඇති අතර මේ හේතුව නිසා වනසංරක්ෂක නිලධාරීන් අධිකරණයේ ඉදිරියේ ඉතා අසීරු තත්ත්වයකට පත්ව ඇති බැව් කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය වෙත වාර්තා වී තිබේ.

මේ අනුව වර්තමානයේ පවත්නා මෙම තත්ත්වය රජයේ ඉඩම් පාලනය කිරීම මෙන්ම පාරිසරික - සමාජීය හා රටේ පවත්නා සංස්කෘතිකත්වයට ද අහිතකර ලෙස බලපා ඇත. එසේම විවිධ දෙපාර්තමේන්තු වලට තම ආයතනවල සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීමේදී මෙය ද එක් ගැටළුවක් වී ඇති බැවින් ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් රජයේ ඉඩම් බෙදාදීමක් සිදුකරන අවස්ථා වලදී ඉ. සං. ආ. පනතේ දක්වා ඇති උපදෙස් හා මෙම චක්‍රලේඛනයේ සඳහන් උපදෙස් අනුව ක්‍රියාකොට අවසාන වශයෙන් ඉඩම් කච්චේරි පැවැත්වීමට අවසර ලබාගත යුතු නිසි බලධාරියා වන ඉඩම් කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගැනීම දක්වා වූ ක්‍රියාවලිය ඒ ඇයුරින්ම අනුගමනය කළයුතු බවද මෙයින් දන්වා සිටිනු කැමැත්තෙමි.

සුමන බන්ඩාර බැද්දෙවෙල,
ඉඩම් කොමසාරිස්.

පිටපත්:- 1. ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

2/....

2. ලේකම්,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය - ඔබගේ අංක. 12/2/1/140 හා
99.12.07 ලිපිය අනුව දැන ගැනීම සඳහා.

3. ලේකම්,
වන සම්පත් හා පරිසර අමාත්‍යාංශය.

4. සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්

5. සියලුම දිසා ලේකම්වරුන්

6. මිනුම්පති,
මිනුම්පති දෙපාර්තමේන්තුව.

අ/-